නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා
ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

# නාගරික සංවර්ධන අධිකාරිය

## ආයෝජන යෝජනා කැඳවීමයි (RFP)




# කොළඹ 03 කොල්ලුපිටිය පෙරහැර මාවතෙහි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

**නිර්මාණය - මූල්‍යනය - ඉදිකිරීම - මෙහයවීම - අයිතිය (DFBOO)** පදනම මත දේශීය හෝ විදේශීය ලංසුකරුවන් (ආයෝජකයන් / සංවර්ධනකරුවන්) වෙතින් ආයෝජන යෝජනා (RFP) කැඳවනු ලැබේ.

| පිහිටීම | මිනින්දෝරු සැලැස්මට අනුකූලව විස්තර | ප්‍රමාණය | පදනම් මිල (ශ්‍රී ලංකා රු.) | ඇප බැඳුම්කරය (ශ්‍රී ලංකා රු.) | බදු කාලය (අවුරුදු) |
|---|---|---|---|---|---|
| පෙරහැර මාවත, කොල්ලුපිටිය, කොළඹ 03 | මිනින්දෝරු සැලසුම් අංක 6242 දරන සැලැස්මේ කැබලි අංක A | පර්චස් 115.95 | 1,127,000,000/- | 20,000,000/- | 99 |

මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට (ආයොජකයින්/ සංවර්ධනකරුවන්) අදාළ විස්තර ඇතුලත් ආයෝජන යෝජනා කැඳවීමේ ලේඛණය ආපසු නොගෙවනු ලබන රු. 100,000/- ක මුදලක් (බදු ඇතුලත්ව) බත්තරමුල්ල, සෙත්සිරිපාය - අදියර 1, 6 වන මහලේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරියේ මුදල් අංශයට ගෙවීම්කර, 8 වන මහලේ පිහිටි එම අධිකාරියේ දේපල කළමනාකරණ හා සංවර්ධන අංශය වෙතින් **2022** මාර්තු මස **29** දින සිට **2022** අප්‍රේල් මස **29** දින දක්වා සතියේ වැඩකරන දින වල පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා කාලය තුළ දී ලබාගත හැක.

පූර්ව ලංසු රැස්වීම **2022** අප්‍රේල් මස **20** වන දින පෙ.ව. 10.00 ට සෙත්සිරිපාය, අදියර 1, 9 වන මහලේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරියේ ශ්‍රවනාගාරයේ දී පැවැත් වේ.

සංවර්ධන යෝජනා භාරගැනීම **2022** මැයි මස **06** වන දින පෙ.ව.**11.00** ට අවසන් වේ.

ලැබී ඇති තාක්ෂණික යෝජනා එසැණින් විවෘත කිරීම බත්තරමුල්ල, "සුහුරුපාය" 17 වන මහලේ පිහිටි, නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණික) කාර්යාලයේ දී සිදු කරන අතර, ඒ සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.

**පිහිටීම**
**6°54'58.23"N**
**79°51'4.84"E**

වැඩි විස්තර :
**අධ්‍යක්ෂ (දේපල සංවර්ධන),**
**දේපල සංවර්ධන හා කළමනාකරණ අංශය,**
**නාගරික සංවර්ධන අධිකාරිය, 8 වන මහල,**
**සෙත්සිරිපාය අදියර 1, බත්තරමුල්ල**

දුරකථන අංක : **011-2875921, 011-23611950,** හෝ
**011- 2875916 - 20** දිගුව **- 2960- 2967**
ෆැක්ස් **011- 2875900**
විද්‍යුත් තැපැල : realestatedivisionuda@gmail.com ,
වෙබ් අඩවිය : www.uda.gov.lk

**සභාපති,අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර සමාලෝචන කමිටුව,**
**නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,**
**17 වන මහල, "සුහුරුපාය" බත්තරමුල්ල**